# ශ්‍රී ලංකාවේ පැරණි අභිලේඛනවලින් හෙළිවෙන දේශීය වෛද්‍ය ශිල්පය පිළිබඳ අධ්‍යයනයක් (අනුරාධපුර හා පොළොන්නරු අවධි)

සෝමානන්ද හිමි, කුඩාවැවේ[1]
[1]සමාජීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර.

**සංක්ෂිප්තය**

දේශීය වෛද්‍ය වෘත්තිය සමාජය උදෙසා කළ අත්‍යවශ්‍ය සේවාව මත පුරාතන අවධියේ සිට ම ශ්‍රී ලාංකේය සමාජය තුළ පිළිගැනීමට ලක් වූ බව අභිලේඛන මූලාශ්‍ර මගින් සනාථ කරගත හැකි වේ. දේශීය වෛද්‍ය වෘත්තිය පිළිබඳ සමකාලීන සෙල්ලිපිවල සඳහන් තොරතුරු ගෙනහැරපෑම, වෛද්‍ය වෘත්තිය හා සම්බන්ධ තොරතුරුවල සත්‍යතාව තහවුරු කරගැනීම, දේශීය සමාජය තුළ වෛද්‍ය සංකල්ප ක්‍රියාත්මක වූයේ කෙසේ ද යන්න මතු කර ලීම, මෙරට සමාජ ප්‍රගමනයට වෛද්‍ය වෘත්තිය යොදා ගැනීම ගෙනහැර පෑම යන්න අනුරාධපුර හා පොළොන්නරු යුගයන්හි අභිලේඛන ප්‍රධාන මූලාශ්‍රයක් වශයෙන් ගෙන ඉස්මතු කරලීම මෙන් ම සාහිත්‍ය මූලාශ්‍ර සමග සසඳා වෛද්‍යමය තොරතුරු අනාවරණය කරගැනීම වැදගත් වේ. වෛද්‍යමය කරුණු ඇතුළත් අනුරාධපුර පුවරු ලිපිය (5 කාශ්‍යප රජු කල), ජේතවන පුවරු ලිපිය (4 මහින්ද රජු කල), කුකුරුමහන්දමන ටැම් ලිපිය (4 කාශ්‍යප රජු කල), කිරිබත් වෙහෙර ලිපිය (4 කාශ්‍යප රජු කල), දොරබාවිල ටැම් ලිපිය, මැදිරිගිරි පර්වත (5 කාශ්‍යප රජු), පොළොන්නරු රාජසභා ටැම් ලිපිය ආදිය ඇතුළත් Epigraphia Zeylanica, Inscription of Ceylon යන ශිලාලේඛන සංග්‍රහයන් මේ සඳහා යොදාගත හැකි ප්‍රධාන මූලාශ්‍ර ග්‍රන්ථයන් ය. ක්‍රි. පූ. දෙවන ශත වර්ෂයේ සිට ක්‍රි. ව. දොළොස් වැනි ශත වර්ෂය දක්වා වූ කාලය තුළ රචිත අභිලේඛන ඒ සඳහා සාක්ෂි දරයි. පූර්වබ්‍රාහ්මී අභිලේඛනයන්හි "වෙජ" නැතහොත් " වෙඣ" (පාලිː වෙජ්ජ, සංස්කෘතː වෛද්‍ය) යන්න භාවිත කොට ඇති අවස්ථා තිබේ. නව වැනි, දස වැනි සියවස්හි සෙල්ලිපිවල භික්ෂූන්ට පූජා කළ ඖෂධ ද්‍රව්‍ය, රෝහල්, බෙහෙත් ගෙවල්, වෛද්‍යවරුන් මෙන් ම ඔවුනට කළ ප්‍රදානයන් ගැන ද වෛද්‍යවරුන් සමාජයේ වැදගත් පිරිසක් වශයෙන් සිටි බවට ද තොරතුරු ඇතුළත් ය. තව ද පසුකාලීන ශිලා ලේඛනවලින් රෝහල් සඳහා ලැබුණු රාජ්‍ය අනුග්‍රහය, ඒ සඳහා පැනවූ නීති-රීතිත් දඬුවම් ක්‍රමත් ප්‍රසාද දීමනා පිළිබඳවත් එන තොරතුරු ශිලා ලේඛන තුළින් හෙළිකර ගැනීමට හා තහවුරු කරගැනීමට හැකිවීම ඓතිහාසික වශයෙන් සනාථ කරවන්නකි. එසේ ම හතර වැනි මිහිඳු රජුගේ මිහින්තලා සෙල් පුවරු ලිපිවලින් පැරණි වෙදකම් හා වෙදහල් පිළිබඳ වැදගත් තොරතරු රාශියක් ලබාගත හැකි ය. මේ හැර අත්තානි පරිහාර ටැම් ලිපි සහ වෙනත් ටැම් ලිපිවලින් නොයෙකුත් වෛද්‍යමය තොරතුරු රාශියක් හෙළිකර ගත හැකි වෙයි. මෙවැනි තොරතුරු ඇතුළත් සෙල්ලිපි වශයෙන් පිච්චන්ඩියාව සෙල්ලිපිය, රාජාංගනය සෙල්ලිපිය, තෝනිගල පර්වත ලිපිය යන ඒවා දැක්විය හැකි ය. ඒ අනුව පුරාතන ශ්‍රී ලංකාවේ වෛද්‍ය ශිල්පය පිළිබඳ වැදගත් තොරතුරු රාශියක් අභිලේඛන තුළින් අනාවරණය කරගත හැකි බවට නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පදඃ** දේශීය වෛද්‍ය වෘත්තිය, අභිලේඛන, මූලාශ්‍ර, අනුරාධපුර පොළොන්නරු අවධි

**විද්‍යුත් ලිපිනයඃ** somananda.kuda@gmail.com